**කොළොන්නාව නගර සභාව - 2021**
**-----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කොළොන්නාව නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කොළොන්නාව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිතියේ 9.8 වගන්තිය ප්‍රකාරව රජයෙන් වන පරිත්‍යාග/ආධාර ආදිය ලැබීම් අදාල කාල පරිච්ඡේදයේ හදුනාගෙන නොතිබුණි. | එක් එක් ආයතනවලින් පරිත්‍යාග අයිතමයන්හි වටිනාකම් ලබාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ප්‍රමිතියේ 11.9 වගන්තිය ප්‍රකාරව අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් සඳහා වන ප්‍රතිපාදන සම්බන්ධයෙන් කාල පරිච්ඡේදය ආරම්භයේදී සහ අවසානයේදී ධාරණ අගය කාල පරිච්ඡේදය තුළදී එකතු කිරීම් සහ අඩුකිරීම්, ප්‍රයෝජනයට නොගත් වටිනාකම් ආදිය පිළිබඳ සංසන්දනයක් හෙළිදරව් කර නොතිබුණි. | මෙම වර්ෂයේ සිට හෙළිදරව් කිරීමට කටයුතු කරමි. | ප්‍රමිත හා ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී මාර්ග පුළුල් කිරීම හේතුවෙන් මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලැබුණු රු.32,946,800 ක් හා අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමේදී යකඩ හා කම්බි වැනි දෑ විකිණීමෙන් ලද මුදල් රු.1,277,463 ක් වශයෙන් මුළු එකතුව රු.34,224,263 ක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කරනු වෙනුවට වත්කම් විකිණීමෙන් ලද ලාභ ලෙස ගිණුම්ගත කර තිබුණි. | පිළිගනිමි. එවැනි වටිනාකම් ඉදිරියේදී විවිධ ආදායම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | අදාල ගිණුම් හඳුනාගෙන ආදායම් ලෙස නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී සභාව විසින් මෝටර් රථ 05 ක් හා එක් යන්ත්‍රයක් රු.3,466,820 ක මුදලකට විකුණා තිබුණු අතර එම මුළු මුදලම වත්කම් විකිණීමේ ලාභය ලෙස ගිණුම්ගත කර තිබුණි. වත්කමේ පිරිවැය සහ වත්කම්වලට අදාළ සමුච්චිත ක්ෂය ගැලපීමෙන් පසුව එම වත්කම් විකිණීමේ ලාභය රු.1,347,340 ක්ද, අලාභය රු.42,200 ක්ද වූ අතර එය වෙන් වෙන්ව මූල්‍ය ප්‍රකාශනවල ගලපා නොතිබුණි. | වත්කම් විකිණීමේ ලාභ ලෙස මූල්‍ය ප්‍රකාශන සටහන් 7 යටතේ ගිණුම්ගත කර ඇති මුදල රු.37,691,083 කි.<br>වාහන විකිණීමෙන් ලද මුලු මුදලම ලාභය ලෙස හඳුනාගෙන ඇති බැවින් එම රු.3,466,820 ක වටිනාකම සමුච්චිත අරමුදල් හා අධිකතා ඌනතා ගිණුමෙන් ඉවත් කරමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | 2020 වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් රු.5,735,537 කට අදාලව 2021 වර්ෂය වෙනුවෙන් ක්‍රමක්ෂය වටිනාකම රු. 1,147,107 ක් ගිණුම්ගත කර නොතිබුණි. | අතපසුවීමකින් ගිණුම්ගත කිරීම මගහැරී ඇත. එම වටිනාකම 2022 JE 04 මගින් ගිණුම්ගත කර ඇත. | වර්ෂයට අදාල ක්‍රමක්ෂය නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |

**1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගිණුම් විෂයයකට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම හා උපලේඛන අනුව වටිනාකම අතර රු.3,728,661 ක වෙනසක් නිරීක්ෂණය විය. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. |

**1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගිණුම් විෂයයන් 06කට අදාලව එකතුව රු.63,318,962 ක් වූ වත්කම් / වටිනාකම් සමාන කිරීම සඳහා පෙන්වා දී තිබූ සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හා පිළිගැනීමට නොහැකි විය. | ශේෂ නිරවුල් කරනතෙක් අදාල ගිණුම්වලට මාරුකර ඇත. ලේඛනවල අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරමින් පවතී. | ඉදිරිපත් නොකළ සාක්ෂි කඩිනමින් ඉදිරිපත් කළ යුතුවීම. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| නගර සභා ආඥා පනතේ (අ) 170 (2) වගන්තිය | සභාවට අයත් ගෙවීම් අයකරගෙන නගර සභාවේ අරමුදලට බැර කිරීම සඳහා අවශ්‍ය සියළු පියවර ගැනීම සභාවේ ලේකම්ගේ කාර්යය විය යුතු වුවත් 2021 වර්ෂය වෙනුවෙන් සභාව විසින් දේපල 23 ක වරිපනම් බදු මුදලක් නිදහස් කර තිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි බදු නිදහස් කිරීම් සිදු කර ඇත්තේ එකී දේපලයන් පදිංචියෙන් හා භාවිතයෙන් තොරවීම නිසාය. යම් නිශ්චිත දේපලක් පැවතීම වරිපනම් උපචිත වීම සඳහා කාරණයක් නොවන අතර නගර සභා ආඥා පනතේ 166 වැනි වගන්තිය සමඟ | නගර සභා ආඥා පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | | කියවිය යුතු මහ නගර සභා ආඥා පනතේ 240 විධි විධාන අනුව බදු සහන ලබා දීම සඳහා නෛතික බලය සභාවට ලැබේ. බදු සහන ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇති දේපල ආදායම් පරීක්ෂකවරුන් විසින් විධිමත් පරිදි කාර්තුවෙන් කාර්තුව ක්ෂේත්‍ර පරීක්ෂණ මඟින් බදු නිදහස් කිරීම සඳහා සුදුසුකම් පරීක්ෂා කර වාර්තා ,බදු කමිටු වෙතත් මහ සභාව වෙතත් ඉදිරිපත් කර විධිමත් අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව බදු නිදහස් කිරීම් කර ඇති බව දන්වමි. | |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** XIX පරිච්ජේදය -------------------- | | | |
| (i) 6:2 ජේදය | රජයේ නිවාසයක් වෙන්කර දිය හැක්කේ සේවයේ යෙදී සිටින රජයේ නිලධාරියකුට පමණක් වුවත් ඊට පටහැනිව විශ්‍රාම යාමෙන් පසු කොන්ත්‍රාත් පදනම මත සභාවේ සේවය කරනු ලබන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා වෙත සභාවට අයත් ලේකම් නිල නිවස 2009 ජනවාරි මාසයේ සිට ලබා දී තිබුණි. | ලේකම් නිල නිවස සහ ඊට අදාල ඉන්වෙන්ට්‍රි භාණ්ඩ භාර දීමට කටයුතු කරන ලෙස ඔහුට ලිඛිතව දැනුවත් කරන ලදි. ඊට පිළිතුරු ලෙස විශ්‍රාමික නිලධාරීන් නැවත සේවයේ පිහිටුවීම සඳහා නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2018 හි 10 වගන්තිය අනුව නැවත සේවයේ පිහිටුවීමේ තනතුරට හිමි අනෙකුත් පහසුකම් ලබාදිය යුතුය යන විධිවිධාන ප්‍රකාරව නිල නිවස පරිහරණයට හැකියාව පවතින බව දක්වා ඇත. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2018 හි 10 වගන්තිය ප්‍රකාරව මෙම නිල නිවාසය පරිහරණය සම්බන්ධයෙන් අදාල නොවන බැවින් නිල නිවස සහ එහි පවතින ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ආපසු ලබාගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ii) 7:1 ඡේදය | නිල නිවසින් අස්වී යන ලෙස නිලධාරියෙකුට නියම කල විට ඔහු එසේ නොකලහොත් 1971 අංක 3 හා 1974 අංක 40 දරන පනත්වලින් සංශෝධිත 1969 අංක 7 දරන රජයේ නිවාස (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත යටතේ ඔහු එම නිවාසයෙන් ඉවත් කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි.එසේම පනතේ 7.2 වගන්තිය ප්‍රකාරව බදු කාලය ඉක්මවා පදිංචිව සිටින කාලය වෙනුවෙන් දඩ මුදලක්ද අයකර නොතිබුණි. | 2020 මුල් කාර්තුවේදී ඇතිවූ කොවිඩ් 19 වසංගතයත් සමඟ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සේවය දිවා රාත්‍රී අත්‍යාවශ්‍ය වූ බැවින් නිල නිවස පරිහරණය පිළිබඳ සහනයක් සළසන ලදි. පළාත් පාලන කොමසාරිස් වෙත යවා ඇති ලිපියට පිළිතුරු ලද පසු දඩ මුදල් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගනු ඇත. | රජයේ නිල නිවාස පනතෙහි උපදෙස් ප්‍රකාරව නිල නිවස නොපමාව ආපසු ලබාගත යුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.55,553,691 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු. 19,217,504 ක් වුයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.36,336,087 කින් වර්ධනය වී තිබුණු බව නිරීක්ෂණය විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟහිටි වරිපනම් වටිනාකම රු.62,802,298 ක් වූ අතර එකී වරිපනම් හිඟයෙන් රු.7,155,893 ක් සම්බන්ධයෙන් 2016 වර්ෂයෙන් පසු කිසිදු මුදලක් සභාව විසින් අයකර ගෙන නොතිබුණි. | ඉදිරියේදී දේපල තහනම් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඉතිරි හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟහිටි වරිපනම් ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් 2013 මාර්තු 13 දින සභාව වෙත ලබා දුන් රුපියල් මිලියන 4 ක් වටිනාකමැති අත් කඩදාසි යන්ත්‍රය සභාවේ වත්කම් ලෙස ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. එසේම එම යන්ත්‍ර කොටස් නිෂ්පාදන කාර්යයන් සඳහා යොදා ගැනීමකින් තොරව නිෂ්ක්‍රීයව තබා තිබුණි. | පිළිගනිමි. මෙම යන්ත්‍රයේ කොටස් මෙම සභාව වෙත ලබා දෙන අවස්ථාවේම යන්ත්‍රය කොටස් වලට වෙන්කර තිබූ අතර එම කොටස් වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන ඉන්වෙන්ට්‍රිගත කිරීමට තරම් දැනුමැති නිලධාරියෙක් සභාවේ සේවයේ නියුතුව නොසිටි හෙයින් අත් කඩදාසි යන්ත්‍රයේ කොටස් ඉන්වෙන්ට්‍රි ලේඛනගත කර නොමැත. එම යන්ත්‍ර කොටස් භාර ගන්නා අවස්ථාවේ යන්ත්‍ර කොටස් වෙන් වෙන්ව විධිමත් ලෙස හඳුනාගත නොහැකි වීම හේතුවෙන් රූප සටහන් ඇඳ ගනිමින් එම අවස්ථාවේ පැවති කොටස් ප්‍රමාණයන් සටහන් කරගෙන ගොනු ගත කර ඇත. මෙම යන්ත්‍ර කොටස් එකලස් කර නැවත ක්‍රියාත්මක තත්ත්වයට පත්කර ගැනීමට නොහැකි තත්ත්වයේ පැවතුණි. | වත්කම් විධිමත් පරිදි ලේඛනගත කිරීමටත් ඒවා අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගැනීමටත් කටයුතු කළයුතු වේ. |

### 3.2 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රවර්තන වර්ෂයේ සංවර්ධන කටයුතු 13 ක් වෙනුවෙන් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය වූ රු.31,908,100න් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් රු.26,560,000 ක් උපයෝජනය කර නොතිබුණි. | රු.26,560,000/- ක මුදලක් උපයෝජනය වීමක් සිදු නොවූයේ 2021 වර්ෂයේ ජනවාරි මාසයේ සිට ඔක්තෝම්බර් මාසය පමණ තෙක් කොවිඩ් වසංගතය හේතුවෙන් රට වසා තැබීම , ආයතනය වසා තැබීම වැනි හේතු කාරණා මතය. විශේෂයෙන් සංස්කෘතික, සාහිත්‍ය උත්සව නොපැවැත්වීම, මාර්ග , පාලම් . බෝක්කු , කාණු ආදී සංවර්ධන කටයුතු සිදු නොවීම හේතුවෙන්ද ප්‍රතිපාදන ඉතිරි විය. | ප්‍රතිපාදන කාර්යක්ෂම ලෙස කළමනාකරණය කළ යුතුවේ. |